සැ. යු. - මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.
2011.05.20 දින පළ වූ අංක 1707 දරන ගැසට් පත්‍රයේ II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,708 - 2011 මැයි මස 27 වැනි සිකුරාදා - 2011.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 940 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 947 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 948 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූනි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 මැයි මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## තංගල්ල නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

තංගල්ල නගර සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් තංගල්ල නගර සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

*උපලේඛනය*

| | *තනතුර* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය (මාසික)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු | 02 | රු. 11,730-10x120-10x130-10 x145-12x160-රු. 17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය (6 වසර) සමත් වී තිබීම |
| 02 | මාර්ග කම්කරු | 02 | රු. 11,730-10x120-10x130-10 x145-12x160-රු. 17,600 | අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් යටත් පිරිසෙයින් 05 වැනි ශ්‍රේණිය (6 වසර) සමත් වී තිබීම |

*අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :*

01. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාව මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ හෝ සිය තනතුර අතහැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතුය ;
02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
03. යම් අපරාධ නීති කෘත්‍යයක දී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයක දී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
04. වස්තු හංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතුය.
05. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
06. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
07. 2011.06.20 දිනට වයස අවු. 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.).
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි.
09. මෙම බඳවා ගැනීම අයදුම්පත් කැඳවන අවස්ථාවේ දී හෝ ඊට පසුව හෝ අතරමග දී හෝ අතහැර දැමීමට තංගල්ල නගර සභාවට බලය ඇත.

*විශේෂ සුදුසුකම් :*

01. අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ තංගල්ල නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.
02. මාර්ග කම්කරු තනතුර සඳහා ත්‍රිරෝද රථ හෝ බර වාහන රියැදුරු බලපත්‍රයක් තිබීම, විදුලි කාර්මික හා යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳ දැනුමක් තිබීම. පෙදරේරු ශිල්පය හා වඩු ශිල්පය ගැන දැනුමක් හා පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

    මෙම විශේෂ සුදුසුකම් සම්පූර්ණ කරන අයට ප්‍රමුඛතාව ලබාදෙනු ලැබේ.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

01. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

02. රජයේ ප්‍රතිපත්තිවලට ද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත් සභාව විසින් වරින්වර පනවනු ලබන රීති හා නියෝගවලට ද , ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ, උපදෙස්, දෙපාර්තමේන්තු නියෝගවලට ද, ඒවාට අදාලව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද, තංගල්ල නගර සභාව විසින් කරනු ලබන නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට බැඳී සිටිය යුතුය.

03. රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුව ඇප තැබිය යුතුය.

04. රජයේ ප්‍රතිපත්තිවලට අදාලව නියම කරනු ලබන භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

05. බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව තහවුරු වුවහොත් පත්වීම අහෝසි කරනු ලැබේ.

06. බඳවා ගනු ලබන සේවකයින් ස්ථාන මාරු කිරීම්වලට යටත්වේ.

07. පත්වීම් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක නොවන සේවකයින්ගේ සේවය අවසන් කරනු ලැබේ.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි සකස් කරන ලද අයදුම්පත් 2011.06.20 දිනට පෙර ලැබෙනසේ "සභාපති, තංගල්ල නගර සභාව, තංගල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් තංගල්ල නගර සභාවේ ලේකම් වෙත අතින් භාර දී එය භාරදුන් බව සනාථ කරගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙළවරේ "............................................ (තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත සමග පහත සඳහන් ලියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය :-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය ;
5. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් ;
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;
7. විශේෂ සුදුසුකම් පිළිබඳ සහතික.

අනිල් සෙල්ලාහැන්නදි,
සභාපති,
තංගල්ල නගර සභාව.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*තංගල්ල නගර සභාව*

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම - 2011*

*........................................ තනතුර*

01. *(අ)* මුලකුරු සමග නම :——————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
03. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.
04. ස්ථිර ලිපිනය :——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
06. විවාහක/අවිවාහක බව : ——————.
07. උපන් දිනය:
අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
2011.06.20 දිනට වයස :
අවුරුදු : ——————. මාස :——————. දින:——————.
08. ජාතික හැඳුනුම්පත් අංකය :——————.
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————.
10. අධ්‍යාපන සුදුසුකම් : ——————.
11. වෙනත් සුදුසුකම්: ——————.
12. වෘත්තීය සුදුසුකම්:——————.
13. විශේෂ සුදුසුකම් : ——————.
14. සේවා පළපුරුද්ද :
(i) දැනට සේවය කරන ආයතනය:——————.
(ii) දැනට දරන තනතුර :——————.
(iii) එම තනතුරට පත්වූ දිනය :——————.

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුරු :——————.

15. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරාගැනීමෙන් පසුව ඒ බැව් හෙළිවුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ——————.

*දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි/නොකරමි.

______________,
දෙපාර්තමේන්තුවේ/ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

නම : ——————.
පදවි නාමය : ——————.
ආයතනය : ——————.
දිනය : ——————.

05-663

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

කොට්ටාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව

කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන්ට හා දැනටමත් තාවකාලික, අනියම් හා ආදේශක සේවයේ නියුතු අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර "ලේකම්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට 2011.06.10 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු . අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III | 01 | PL1- 2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130<br>10 x 145 - 12 x 160 -රු. 17,600<br>(2 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අධ්‍යාපන සුදුසුකම් සළකා බලනු නොලැබේ |
| 02 | විදුලි කම්බිකරු III සහායක | 01 | PL1 - 2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130<br>10 x 145 - 12 x 160 - රු. 17,600<br>(4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/09වැනි වසර සමත් වී තිබීම |
| 03 | සුළු පරිපාලක (මාර්ග) II | 01 | MN1 - 2006A<br>රු. 13,120 - 10 x 145 - 11 x 170<br>10 x 240 - 10 x 320 - රු. 22,040<br>(කාර්යක්ෂමතා කඩඉම 2 වැනි පියවරේ සිට) | ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය (කාර්යක්ෂමතා කඩඉම 2 වැනි /අංක ගණිතය/වාණිජ අංක ගණිතය සහ පියවරේ සිට) සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සහිතව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම. හෝ<br>ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගයෙන් එකම වතාවක දී ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 06කින් සාමාර්ථය ලබා තිබීම හෝ<br>පළාත් පාලන ආයතනයක අවු 10 කට නොඅඩු අඛණ්ඩසේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් 08 වැනි පන්තිය සමත්ව තිබීම |

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 04. | වීථිපහන් දල්වන්නා | 01 | PL1- 2006A රු. 11,730 - 10 x 120 - 10 x 130 10 x 145 - 12 x 160 - රු. 17,600 (4 වැනි වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.) | අවම වශයෙන් 08 වැනි ශ්‍රේණිය/09 වැනි වසර සමත් වී තිබීම. |

*02. බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(1) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
(2) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03 ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(3) අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බලනොපානු ඇත.)
(4) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
(5) සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයන් හා ලිඛිත පරීක්ෂණයන් මගින් සුදුස්සන් තෝරනු ලැබේ.

*03. සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(2) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, බස්නාහිර පළාත් සභාවේ හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු ය.*

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතකදී ලබා ගත් ග්‍රාම සේවා සහතිකය,
5. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
6. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික,
7. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

*04. අයදුම් කළ යුතු ආකාරය :*

(1) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2011.06.10 වැනි දිනට පෙර "ලේකම්, කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව, ගොතටුව නව නගරය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(2) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
(3) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
(4) අතින් ගෙනැවිත් භාර දෙන අයදුම්පත් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැලකිය යුතුයි :* මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

වසන්ති වික්‍රමරත්න,
ලේකම් *(වැ.බ.)*,
කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව.

2011 මැයි මස 10 වැනි දින,
ගොතටුව නව නගරය,
කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කොට්ටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ..... තනතුර සඳහා බඳවා ගැනීම**

(1) *(අ)* මුලකුරු සමග නම :—————————.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————————.
(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————————.
(3) ස්ථිර ලිපිනය :—————————.

(4) *(අ)* ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? :—————————.
(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචිවීමෙන් ද? :—————————.
(5) ජාතික හැඳුනුම්පත් අංකය :—————————.
(6) ස්ත්‍රී/පුරුෂ භාවය :—————————.
(7) විවාහක/අවිවාහක තත්ත්වය :—————————.
(8) දුරකථන අංකය :—————————.
(9) උපන් දිනය :
වර්ෂය :—————————, මාසය :—————————, දිනය :—————————.
(10) 2011.06.10 දිනට වයස :—————————.
අවු :—————————,මාස :—————————, දින :—————————.
(11) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :—————————.
(12) වෘත්තීය සුදුසුකම් :—————————.
(13) සේවා පළපුරුද්ද :—————————.
(14) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියේ වරදකරුවෙකු කරනු ලැබ තිබේද? :—————————.
(15) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :—————————.

මෙහි සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවරුදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත්, පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

—————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම අයදුම්කරු වන............ මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ...... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

—————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :—————————.
පදවි නාමය :—————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :—————————.
(නිල මුද්‍රාව යොදන්න.)
දිනය :—————————.

05-645

---

**තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර**

පුස්තකාල සේවිකා තනතුර සඳහා බඳවා ගැනීම

තුම්පනේ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවම වශයෙන් වසර පහක්වත් ස්ථිර පදිංචි පහත සඳහන් සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුරු නාමය | - | පුස්තකාල සේවිකා |
| තනතුරු සංඛ්‍යාව | - | 01 |
| වැටුප් පරිමාණය | - | රු. 11,730X10 x 120-10 x 130-10 x 145-12 x 160- රු.17,600 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 විධි විධාන යටතේ වැටුප් ගෙවනු ලැබේ.) |

සුදුසුකම් :-

(1) *වයස :-*
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

2. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :-*

දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

අයදුම්කරුවන් ලියාපදිංචියෙන්/පරම්පරාවෙන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.

අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

3. *බඳවා ගැනීමේ ක්‍රමයඃ-*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදුකරනු ලැබේ.

ලකුණුදීම :-

(අ) අධ්‍යාපන සුදුසුකම් ;
(ආ) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද;
(ඇ) සභා සේවය හා පදිංචිය;
(ඈ) පෞරුෂත්වය හා සෞඛ්‍ය සම්පන්න බව;
(ඉ) ප්‍රායෝගික කුසලතා.

යන ශීර්ෂ යටතේ උපරිම ලකුණු 20 බැගින් සම්පූර්ණ ලකුණු 100න් යුක්ත වේ.

4. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5. *සේවා කොන්දේසි :*

මෙම තනතුර මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අයත් වන අතර, පත්වීම කුම්පනේ ප්‍රාදේශීය සභාවට පමණක් සීමා වේ.

ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, මුදල් රෙගුලාසිවලටද, මෙම ප්‍රාදේශීය සභාව හෝ මධ්‍යම පළාත් සභාව හෝ රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට අනුකූලව කටයුතු කිරීමට යටත් වනු ඇත.

දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය කුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

කුම්පනේ ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, තාවකාලික, කොන්ත්‍රාත්, ස්වේච්ඡාවෙන් සේවය කරනු ලබන සේවකයින් කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

6. *ඉල්ලුම් කළයුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව තමන් විසින් අයදුම් පත්‍රයක් සකස් කර ගත යුතු යි.

සම්පූර්ණ කරගත් අයදුම්පත් 2011.06.17 වැනි දිනට පෙර ලේකම්, කුම්පනේ ප්‍රාදේශීය සභාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනටමත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියවිලිවල සහතික කළ ඡායා පිටපත් එවිය යුතු ය. එම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුවේ.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රදේශීය ලේකම් අනු අත්සන් කළ යුතුවේ.);
4. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
5. මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුයි.).

අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව හෝ පෙනී ගියහොත් අයදුම්කරුවන් හිතාමතාම යම්කිසි වැදගත් කරුණක් යටපත් කර ඇති බව පෙනී ගියහොත් හෝ සේවය කරන කාලය තුළ කවර අවස්ථාවක හෝ නුසුදුසු බව ඔප්පු වුවහොත් ඔහු හෝ ඇය සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

සෙනරත් දසනායක,
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

*ආදර්ශ අයදුම්පත්‍රය*

*පුස්තකාල සේවිකා තනතුර සඳහා බඳවාගැනීම සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :———————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————.
04. ලිපිනය :———————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :———————.
06. විවාහක/අවිවාහක බව :———————.
07. උපන් දිනය අවුරුද්ද:———————. මාසය:———————. දිනය:———————.
අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :අවුරුදු:———————. මාස:———————. දින:———————.
08. ජාතික හැඳුනුම්පත් අංකය:———————.
09. ජාතිය:———————.
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද, ලියාපදිංචියෙන් ද යන්න.:———————.
11. ඔබ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි වසර ගණන:———————.
12. අධ්‍යාපන සුදුසුකම්:———————.
13. පළපුරුද්ද හා වෙනත් සුදුසුකම්:———————.
14. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර:———————.
15. එම පත්වීමේ ස්වභාවය ස්ථිර/අනියම්/ආදේශක:———————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත් පත්කරනු ලැබීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් මා නුසුදුස්සකු කරනු ලැබීමටත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමටත් යටත් වන බව මම දනිමි.

———————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරුවන .......................................... මහතා/මහත්මිය/මෙනෙවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ, ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත)...................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක./නොහැක.ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:———————.

තනතුර:———————.

දෙපාර්තමේන්තුව:———————.

දිනය:———————.

05-534

# පළාත් පාලන නිවේදන

## යාපනය මහ නගර සභාව

1975 අංක 17 දරන සමාජශාලා සඳහා බලපත්‍ර ලබාදීමේ පනත

පහත නම සඳහන් තැනැත්තා විසින් ඔහුගේ නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පවත්වාගෙන යාම සඳහා 2011 වර්ෂයට ලබා ගැනීම පිණිස මා වෙත අයදුම්පතක් ඉදිරිපත් කර ඇති බව 1975 අංක 17 දරන සමාජශාලා වලට බලපත්‍ර දීමේ පනතේ 6 වැනි වගන්තියේ (ඈ) ඡේදය යටතේ මෙයින් දැනුම් දෙමි.

එකී සමාජ ශාලාව අසල හෝ එකී සමාජ ශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය හෝ අදාළ හෝ පදිංචි යම් තැනැත්තෙකු, එම සමාජශාලාව සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දිනයේ සිට සති හතරක් ඇතුළත තම විරුද්ධත්වයට හේතු ලිඛිතව දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වමි.

සෙල්ලයියා සරවණබව,
මහ නගර කොමසාරිස්,
මහ නගර සභාව,
යාපනය.

2011 මැයි මස 02 වැනි දින,
මහනගර සභාව,
යාපනය.

*උපලේඛනය*

| *අංකය* | *ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය* | *සමාජ ශාලාවේ සභාපතිද, ලේකම් ද, කළමනාකරුද, යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාවේ කටයුතු කරගෙන යෑමට බලාපොරොත්තු වන ස්ථානය* |
|---|---|---|---|---|
| 01 | ඒ. ඒ. ජාන්ස්ටන්, අංක 68, රාසාවන් තෝට්ටම් වීදිය, යාපනය | ලේකම් | සෙවන් ලෙවන් ක්‍රීඩා සමාජය | අංක 66, රාසාවාන්, තෝට්ටම් වීදිය, යාපනය. |

05-524

---

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපතිවන කන්දෙ ආරච්චිලාගේ ඉෂාන්ත අමිල රුවන් කන්දේආරච්චි වන මා හට ගෝසාතක ආඥාපනතේ 14 වැනි වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් දෙහිඕවිට, ඌරුපැලැව්වේ පදිංචි ඒ. ආරියරත්න නමැති අයට අයත් සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර අටුළුගම් කෝරළයේ දෙහිඕවිට ගමේ පිහිටි වරිපනම් අංක 03 දරන පරණවත්ත නමැති ඉඩමේ 2011.12.31 වැනි දින දක්වා මස් පිණිස සතුන් මැරීම සඳහා ගෝසාතකාගාරයක් පවත්වාගෙන යාමට අවසර දෙමි.

කේ. ඒ. අයි. අමිල රුවන්,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2011 මැයි මස 04 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දී ය.

05-726/1

---

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ සභාපති වන කන්දෙ ආරච්චිලාගේ ඉෂාන්ත අමිල රුවන් කන්දේආරච්චි වන මා හට ගෝසාතක ආඥාපනතේ 14 වැනි වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් අවිස්සාවේල්ල නාපාවල පදිංචි එම්. එම්. සිත්ති නදිලියා නමැති අයට අයත් සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම් කෝරලේ, නාපාවල ගමේ පිහිටි පඹේඅතර වත්ත (කොටසක්) නමැති ඉඩමේ 2011.12.31 වැනි දින දක්වා මස් පිණිස සතුන් මැරීම සඳහා ගෝසාතකාරගයක් පවත්වාගෙන යාමට අවසර දෙමි.

කේ. ඒ. අයි. අමිල රුවන්,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.

2011 මැයි මස 04 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ දී ය.

05-726/2

# විවිධ දැන්වීම්

## මුලටියන ප්‍රාදේශීය සභාව
## 2011 වර්ෂය සඳහා වෙලඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 149 හා 150 වගන්තිවලින් සහ මුලටියන ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳගෙන ඇති 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) පළාත් පාලන කොටසේ පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් මෙම සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු 2011 වර්ෂය සඳහා පනවා අයකිරීමට 2010 නොවැම්බර් මස 25 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ අංක 08 දරන සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලබන අතර එකී වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා අදාළ බලපත්‍ර ගාස්තු 2011 මාර්තු මස 31 වැනි දිනට පෙර මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2010 නොවැම්බර් මස 25 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභාව.

### *I වැනි උපලේඛනය*

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු*

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු.750 ට වැඩි නොවන රු. ශත* | *රු.751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *රු.1,500ට වැඩි රු.ශත* |
|---|---|---|---|---|
| 01. | ලැගුම් නිවාසයක් හෝ නවාතැන් පොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ /කෝපි කඩයක් | 150 0 | 200 0 | 250 0 |
| 04. | බත් කඩයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 05. | ආපනශාලා (රෙස්ටුරන්ට්) පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බේකරියක් පැවැත්වීම | 300 0 | 350 0 | 400 0 |
| 07. | කිරි පට්ටියක් පැවැත්වීම - | | | |
| | (i) දෙනුන් 05-10 | 200 0 | 250 0 | 300 0 |
| | (ii) දෙනුන් 10-25 | 300 0 | 350 0 | 400 0 |
| 08. | කිරි වෙළඳාමක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 09. | තිරිඟු පිටිවලින් සෑදූ කෑම වර්ග වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 10. | එළවළු හෝ පළතුරු වෙළෙඳාමක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 11. | රසකැවිලි නිපදවන ස්ථානයක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 12. | සරුවත්, පැණිබීම වෙළෙඳාමක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 13. | මාළු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 300 0 | 400 0 | 500 0 |
| 14. | ශීතකල මස් හෝ මාළු නිපදවන ස්ථානයක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 15. | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | ගව ගාලක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 17. | පොළක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 19. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 20. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |

### *II වැනි උපලේඛනය*

*අන්තරායදායක හා අප්‍රසන්න වෙළෙඳාම ඃ*

| | | | | |
|---|---|---|---|---|
| 01. | කළුගල් වලක් හෝ යාන්ත්‍රික කළුගල් මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | කළුගල් කඩා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 03. | වී මෝලක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |

| | ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750 ට වැඩි නොවන රු. ශත | රු.751 සිට රු. 1,500 දක්වා රු. ශත | රු.1,500ට වැඩි රු.ශත |
|---|---|---|---|---|
| 04. | පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 600 0 | 750 0 |
| 05. | කම්මලක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 06. | පොල්තෙල් මෝලක්/පොල්තෙල් ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 07. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (ඩිජිටල්) | 500 0 | 750 0 | 1000 0 |
| 08. | අතින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 09. | දැව ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 600 0 |
| 10. | යාන්ත්‍රික නොවන ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 350 0 |
| 11. | යාන්ත්‍රික ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම | 600 0 | 850 0 | 1,000 0 |
| 12. | මෝටර්රථ ගරාජයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 700 0 |
| 13. | මෝටර්රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 700 0 | 800 0 | 1,000 0 |
| 14. | යතුරු පැදි හා ත්‍රිරෝද රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 15. | එල්. පී. ගෑස් විකිණීමට ගබඩා කර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 500 0 | 750 0 |
| 16. | කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික පොහොර තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 |
| 17. | කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 |
| 18. | මැණික් ගැරීම හෝ පතල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 300 0 | 450 0 | 600 0 |
| 20. | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 21. | යකඩ ග්‍රිල් හා ගේට්ටු නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ලෝහ නිෂ්පාදන අලෙවිකරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 600 0 |
| 23. | යන්ත්‍රානුසාරයෙන් මිරිස්/තුනපහ ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 550 0 |
| 24. | මිරිස්, තුනපහ, කුළුබඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 450 0 |
| 25. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 350 0 | 400 0 | 500 0 |
| 26. | වඩුමඩුවක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 27. | ග්‍රොස් 10ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1000 0 |
| 28. | කොප්පරා නිපදවීම, සැකසීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 29. | ගිනිපෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 750 0 |
| 30. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 400 0 | 500 0 |
| 31. | ධාන්‍ය හෝ මාශ බෝග වර්ග හොණ්ඩර 5 ට වැඩියෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 32. | වීදුරු කපා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 300 0 | 350 0 | 500 0 |
| 33. | තීන්ත, වාර්නිෂ්, ඩිස්ටැම්පර් වර්ග ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 34. | විකිණීම සඳහා සිමෙන්ති ගබඩා කර තබන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 600 0 |
| 35. | ඇස්බැස්ටෝස් තහඩු වර්ග විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 36. | විකිණීම සඳහා හුණුගල් හෝ හුණු ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 37. | බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 850 0 |
| 38. | විකිණීම සඳහා තේ කුඩු තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 550 0 | 800 0 |
| 39. | රබර් කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 700 0 |
| 40. | රබර් ෂීට් නිෂ්පාදනය කිරීම, දුම් කාමරයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 41. | සජීවී සතුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 42. | කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 350 0 | 400 0 | 500 0 |
| 43. | තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම/ආහාර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 500 0 |
| 44. | ගෘහ භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 500 0 |
| 45. | රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 350 0 |
| 46. | විනාකිරි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 350 0 |
| 47. | පැණි/පැණිහකුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 48. | ටයර්/ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 400 0 |
| 49. | සත්ව සායනයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 50. | කපාපු පොල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 51. | සිසිල් බීම නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 400 0 | 500 0 |
| 52. | කුරුඳු බේල් කිරීමේ හා කුරුඳු කපා සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 700 0 | 800 0 | 1,000 0 |
| 53. | ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |

| | *ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු.750 ට වැඩි නොවන රු. ශත* | *රු.751 සිට රු. 1,500 දක්වා රු. ශත* | *රු.1,500ට වැඩි රු.ශත* |
|---|---|---|---|---|
| 54. | දුම්කොළ ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම (බීඩි නිපදවීම/විකිණීම) | 250 0 | 300 0 | 350 0 |
| 55. | උළු හෝ ගඩොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 400 0 |
| 56. | ආහාර ද්‍රව්‍ය සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 350 0 |
| 57. | ආහාර ද්‍රව්‍ය ගබඩා කර තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | ගෑස් ගබඩා කිරීම හා වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 60. | කුරුඳු සකස් කර ගෙන්දගම් දුම් ගැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | විකිණීම සඳහා රබර් ෂීට් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 300 0 | 350 0 |
| 62. | පොල්තෙල් නිශ්කර්ෂණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 63. | සිමෙන්ති මිශ්‍ර ගඩොල් හෝ හියුම් පයිප්ප නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 64. | කොහුකෙඳි ගබඩා කිරීම, කොහු මෙට්ට නිපදවීම, ගබඩා කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 65. | යන්ත්‍රානුසාරයෙන් බ්ලොක්ගල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 66. | ඇලුමිනියම් හා ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 67. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 68. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 550 0 |
| 69. | ස්වර්ණාභරණ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 450 0 | 1,000 0 |
| 70. | අළුත් ටයර් හෝ රීබිල්ට් ටයර් හෝ පැරණි ටයර් ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 71. | විදුලි උපකරණ ගබඩා කර විකිනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 72. | ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 74. | ලෝහමය සුන්බුන් හෝ බෝතල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 75. | මල් වීදුරු, ජනෙල් වීදුරු ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 76. | අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 450 0 |
| 77. | යෝගට්, මුදවපු කිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 400 0 | 500 0 |
| 78. | මිනීපෙට්ටි නිපදවීම හා ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 350 0 | 500 0 | 750 0 |
| 79. | පොල්කටු අඟුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 250 0 | 300 0 |
| 80. | සත්ව ආහාර ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 350 0 | 400 0 |
| 81. | කොහු, ඉදල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 200 0 | 300 0 | 400 0 |
| 82. | ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 83. | පොලිතින් නිෂ්පාදන ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 400 0 | 500 0 | 600 0 |
| 84. | මෙරට ද්‍රව්‍ය මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |

***150 වගන්තිය ප්‍රකාර ඇතැම් ව්‍යාපාර හෝ කර්මාන්ත පිළිබඳ බදු***

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය ප්‍රකාර මුලටියන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් මත වාර්ෂික බද්දක් පනවනු ලැබ ඇත. ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය, එම ව්‍යාපාරය හෝ කර්මාන්තය පවත්වාගෙන යන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කර ඇති අතර මෙකී වාර්ෂික බද්ද 2011 මාර්තු මස 31 දිනට පෙර මුලටියන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

III වැනිඋපලේඛනය

***150 වගන්තියේ ප්‍රකාරව බදු :***

| | | | | |
|---|---|---|---|---|
| 01. | රෙදිපිළි වෙළෙඳාම | 350 0 | 500 0 | 750 0 |
| 02. | ලිපිද්‍රව්‍ය වෙළෙඳාම පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 03. | පාසැල් උපකරණ වෙළෙඳාම | 300 0 | 350 0 | 400 0 |
| 04. | ඩිස්පෙන්සරියක් පැවැත්වීම(ආයුර්වේද) | 300 0 | 350 0 | 400 0 |
| 05. | ඩිස්පෙන්සරියක් පැවැත්වීම (බටහිර) | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | සාප්පු බඩු වෙළඳාම හා ප්ලාස්ටික් බඩු වෙළෙඳාම | 250 0 | 300 0 | 350 0 |
| 07. | ගුවන් විදුලි , රූපවාහිනී හා විදුලි උපකරණ අළුත්වැඩියාව | 300 0 | 350 0 | 550 0 |
| 08. | අත් ඔරලෝසු අළුත්වැඩියාව/විකිණීම පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |

| | ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750 ට වැඩි නොවන | වාර්ෂික වටිනාකම රු.751 සිට රු. 1,500 දක්වා | වාර්ෂික වටිනාකම රු.1,500ට වැඩි |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු.ශත |
| 09. | යතුරුපැදි අළුත්වැඩියා කිරීම | 300 0 | 400 0 | 500 0 |
| 10. | යතුරුපැදි අමතර කොටස් විකිණීම | 350 0 | 500 0 | 600 0 |
| 11. | පාපැදි අමතර කොටස් වෙළෙඳාම/අලුත්වැඩියා | 250 0 | 350 0 | 500 0 |
| 12. | යතුරුපැදි විකුණන ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | මෝටර්රථ අමතර කොටස් වෙළෙඳාම | 300 0 | 400 0 | 500 0 |
| 14. | සුරතල් මසුන් වෙළෙඳාම පැවැත්විම | 250 0 | 300 0 | 350 0 |
| 15. | ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | විදුලි උපකරණ වෙළෙඳාම පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | පින්තූර රාමුකරන ස්ථානයක් පැවැත්වීම | 200 0 | 250 0 | 300 0 |
| 18. | ලොතරැයි විකුණන ස්ථානයක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 19. | ස්වර්ණාභරණ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 400 0 | 450 0 | 1,000 0 |
| 20. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 300 0 | 400 0 | 600 0 |
| 21. | ලනු/කොහු/ඉදල් පාපිසි භාණ්ඩ නිපදවීමේ/විකිණීමේ ස්ථානයක් | 250 0 | 300 0 | 350 0 |
| 22. | පිත්තල උපකරණ වෙළෙඳාම | 250 0 | 300 0 | 500 0 |
| 23. | නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් | 250 0 | 350 0 | 550 0 |
| 24. | මනාලියන් හැඩගන්වන ස්ථානයක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 25. | ටයර් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 350 0 | 500 0 | 700 0 |
| 26. | රෙකෝඩ්බාර් ආයතනයක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 27. | වීඩියෝ/සීඩී/වීසීඩී/ වෙළෙඳාම හා පටිගත කිරීම/කුලියට දීම | 250 0 | 300 0 | 350 0 |
| 28. | ඡායා පිටපත් ගැනීමේ ස්ථානයක් | 200 0 | 250 0 | 350 0 |
| 29. | දුරකථන ඇමතුම් ගැනීමේ ස්ථානයක් (ටෙලෙක්ස්/ෆැක්ස් සහිත) | 300 0 | 500 0 | 600 0 |
| 30. | උත්සව භාණ්ඩ කුලියට දීම(මඩු, පුටු, පිඟන්) | 400 0 | 500 0 | 750 0 |
| 31. | මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පැවැත්වීම | 300 0 | 500 0 | 600 0 |
| 32. | පාවහන්/සපත්තු අළුත්වැඩියාව | 200 0 | 300 0 | 350 0 |
| 33. | පාවහන් වෙළෙඳාම පැවැත්වීම | 200 0 | 350 0 | 500 0 |
| 34. | බීර විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | වීදුරු භාණ්ඩ/පිඟන් භාණ්ඩ අලෙවි ස්ථානයක් පැවැත්වීම | 250 0 | 300 0 | 400 0 |
| 36. | පරිගණක සේවා සැපයීමේ ස්ථානයක් | 300 0 | 350 0 | 500 0 |
| 37. | විදුලි සංදේශ උපකරණ අලෙවිය/ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 750 0 |
| 38. | මහන මැෂින් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් | 400 0 | 450 0 | 550 0 |
| 39. | පුවත්පත් හා සඟරා අලෙවි කිරීමේ ස්ථානයක් | 200 0 | 250 0 | 300 0 |
| 40. | ජ්‍යොතිෂ කාර්යාලයක් පැවැත්වීම | 250 0 | 300 0 | 400 0 |
| 41. | ලුණු ගබඩා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පැවැත්වීම | 350 0 | 500 0 | 750 0 |
| 42. | නාම පුවරු හා දැන්වීම් පුවරු පැවැත්වීමේ ස්ථානයක් පැවැත්වීම | 300 0 | 400 0 | 500 0 |
| 43. | ඇන්ටනා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 250 0 | 300 0 | 350 0 |
| 44. | ඇළුමිනියම් හෝ ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් | 250 0 | 300 0 | 350 0 |
| 45. | සමුපකාර ප්‍රාදේශික වෙළෙඳසැල් පැවැත්වීම | 200 0 | 300 0 | 350 0 |
| 46. | පරිගණක පහසුකම් සහිත මංගල සේවා | 250 0 | 350 0 | 400 0 |
| 47. | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හා උපකරණ සැපයීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 750 0 |
| 48. | ත්‍රීවීලර් අමතර කොටස් වෙළෙඳාම පැවැත්වීම | 300 0 | 350 0 | 500 0 |
| 49. | ත්‍රීවීලර් අළුත්වැඩියාව පැවැත්වීම | 250 0 | 350 0 | 450 0 |
| 50. | පැල තවාන් කිරීමේ ස්ථානයක් | 200 0 | 300 0 | 350 0 |
| 51. | සම් භාණ්ඩ වෙළෙඳාම පැවැත්වීම | 200 0 | 250 0 | 350 0 |
| 52. | මැටිභාණ්ඩ වෙළෙඳාම පැවැත්වීම | 200 0 | 250 0 | 350 0 |
| 53. | කිරිහලක් පැවැත්වීම | 250 0 | 300 0 | 350 0 |
| 54. | ඡායාරූප ශාලාවක් පැවැත්වීම | 400 0 | 450 0 | 550 0 |
| 55. | දන්ත කාර්මික ස්ථානයක් පැවැත්වීම | 200 0 | 250 0 | 350 0 |
| 56. | අමු තේ දළු එකතු කිරීම පැවැත්වීම | 300 0 | 350 0 | 550 0 |
| 57. | ආගමික ප්‍රතිමා හා වෙනත් විසිතුරු නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පැවැත්වීම | 200 0 | 250 0 | 300 0 |

## IV කොටස - 152 වගන්තිය ප්‍රකාර ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන්වන බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ මුලටියන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පහත 01 වැනි උපලේඛනයේ දැක්වෙන යම් ව්‍යාපාරයක් මත වාර්ෂික බද්දක් පනවනු ලැබ ඇත. ඒ අනුව එම බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයේ

ලැබීම්වලට අනුකූලව පහත 2 වැනි උපලේඛනයේ සඳහන් ප්‍රමාණයන් නොඉක්මවන පරිදි අයකළ යුතු වේ. මෙකී වාර්ෂික බද්ද 2011 මාර්තු මස 31 වැනි දිනට පෙර මුලටියන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතුය.

## IV වැනි උපලේඛනය

1. විකිණීම සඳහා භාණ්ඩ තොග වශයෙන් රැස්කරන ස්ථානයක් පැවැත්වීම
2. තේ කර්මාන්ත ශාලාවක් පැවැත්වීම
3. සැපයුම්කරුවන්
4. ප්‍රසිද්ධ නොතාරිස්/නීතිඥ සේවාවක් සැපයීමේ ස්ථානයක් පැවැත්වීම
5. බැංකුවක් පවත්වාගෙන යාම
6. මූල්‍ය පහසුකම් සපයන ආයතනයක් පැවැත්වීම
7. රියැදුරු පුහුණු ආයතනයක් පැවැත්වීම
8. ලොතරැයි අලෙවි නියෝජිත ධූරයක් පවත්වාගෙන යාම
9. රක්ෂණ නියෝජිත ධූරයක්/රක්ෂණ අලෙවි ආයතනයක් පැවැත්වීම
10. යතුරු පැදි අලෙවි නියෝජිත ධූරයක් පවත්වාගෙන යාම
11. මැණික් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් පැවැත්වීම
12. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පැවැත්වීම
13. රැකියා ඒජන්සියක් පැවැත්වීම
14. රටබීම (අරක්කු) තැබෑරුමක් පැවැත්වීම
15. රෙස්ටුරන්ට් (බාර්) ආයතනයක් පැවැත්වීම
16. ප්‍රවාහන සේවා/ මගී ප්‍රවාහන සේවා සපයන ස්ථානයක් පැවැත්වීම
17. භාණ්ඩ බෙදාහැරීමේ ආයතනයක නියෝජිත ධූරයක් ලබා ගැනීම
18. ප්‍රසිද්ධ සමාගමක භාණ්ඩ ප්‍රදර්ශණාගාරයක්/විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
19. ඉන්ධන පිරවුම් හලක් පැවැත්වීම
20. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
21. යකඩ බඩු(හාඩ්වෙයාර් ද්‍රව්‍ය) විකිණීමේ ස්ථානයක් පැවැත්වීම
22. පරිඝණක පුහුණු හා පාඨමාලා පැවැත්වීමේ ස්ථානයක් පැවැත්වීම
23. කොන්ත්‍රාත්කරුවෙකු ලෙස කටයුතු කිරීම
24. ගෘහ නිර්මාණ සේවා සපයන්නකු/ආයතනයක් පැවැත්වීම
25. මිනින්දෝරු සේවා සපයන්නකු/ආයතනයක් පැවැත්වීම
26. ඇඟලුම් කම්හලක් පැවැත්වීම
27. විශේෂඥ වෛද්‍ය (වැනලින්) සේවාවක් පැවැත්වීම
28. ළී වෙළඳාම පැවැත්වීම
29. මෙරට ද්‍රව්‍ය මිළට ගැනීම පැවැත්වීම
30. ජංගම දුරකථන සම්ප්‍රේෂණ කුළුණු මගින් සේවා සැපයීමේ ස්ථානයක්
31. උකස් බඩු ගන්නා ස්ථානයක් පැවැත්වීම.

## V වැනි උපලේඛනය

| *ව්‍යාපාරයේ වාර්ෂික ලැබීම* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද*<br>*රු. ශත* |
|---|---|
| 1. රු. 6,000 දක්වා | නැත |
| 2. රු. 6,001 සිට 12,000 දක්වා | 90 0 |
| 3. රු 12,001 සිට 18,750 දක්වා | 180 0 |
| 4. රු. 18,751 සිට 75,000 දක්වා | 360 0 |
| 5. රු. 75,001 සිට 1,50,000 දක්වා | 1,200 0 |
| 6. රු. 1,50,001 ට වැඩි | 3,000 0 |

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2010 නොවැම්බර් මස 25 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභාව.

05-675/1

**මුලටියන ප්‍රාදේශීය සභාව**

*නිවාස දේපල සංවර්ධන හා ඉඩම් කට්ටි කිරීමේ/කට්ටි කර විකිණීමේ හා වෙනත් ඉදිකිරීම් - 2011*

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවැනි වගන්තිය යටතේ කියවෙන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 221(අ) වගන්තිය සමග කියවිය යුතු 122 හා 126 යන වගන්ති වලින් ප්‍රාදේශීය සභාවට බලය ලැබී ඇති විධිවිධාන මත 2011.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීමේ/කට්ටි කිරීමේ හා ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම් මත පහත උපලේඛනයේ දැක්වෙන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හා නව ගාස්තු අය කිරීමට 2010 නොවැම්බර් මස 25 වැනි දින පැවති මහා සභා රැස්වීමේ අංක 08 සභා සම්මුතිය මගින් තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කිරීම/කට්ටි කර විකිණීම*

මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සීමාව තුළ පිහිටියා වූ මිනින්දෝරු සැලැස්ම මගින් කොටස් කරනු ලබන්නාවූ ද, සෑම ඉඩමකටම මිනින්දෝරු සැලැස්මක් සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු අතර ඒ සඳහා පහත උපලේඛන ගත අනුබෙදුම් ගාස්තුවක් අය කෙරේ. අවම අනු බෙදුම් ඒකකය පර්චස් 07ක් විය යුතුය :

**ගාස්තු අයකරන උපලේඛනය**

| *ඉඩම් කොටස්* | *රු. ශත* |
|---|---|
| 01 පර්. 07 සිට 20 දක්වා | 100 0 |
| 01 පර්. 21 සිට 40 දක්වා | 150 0 |
| 01 පර්. 41 සිට 60 දක්වා | 250 0 |
| 01 පර්. 61 සිට 120 දක්වා | 350 0 |
| 01 පර්. 121 සිට 160 දක්වා | 450 0 |

01 පර්. 161 සිට වැඩි වන සෑම පර්. 01ක් හෝ ඉන් කොටසකට රු. 5.00 බැගින් අය කෙරේ.

*ගොඩනැගිලි හා වෙනත් ඉදිකිරීම්*

මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සිදු කරනු ලබන සෑම ඉදිකිරීමකදී ම හෝ ගොඩනැගිල්ලක් වැඩි දියුණු කිරීමේ දී ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රයක් ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කර අනුමත කරවා ගත යුතුයි. මෙහිදී අනුමත වීථි රේඛා සීමාව සැලකිල්ලට ගනු ලැබේ. පරීක්ෂණ හා අනුමත කිරීමේ ගාස්තු පහත පරිදි වේ :

01. වර්ග අඩි 750 දක්වා රු. 350.00
02. වර්ග අඩි 751 සිට වැඩි වන සෑම වර්ග අඩි 10 කටම හෝ කොටසකට රු. 10.00 බැගින් අය කෙරේ.
03. ඉහත පරීක්ෂණ ගාස්තුවලට අමතරව ගොඩනැගිලි ඉල්ලුම්පත්‍රයක් වෙනුවෙන් ප්‍රාදේශීය සභාවට රු. 350.00 ක මුදලක් ගෙවා මිල දී ගත යුතුයි.

සුනිල් ඇල්ලදෙනිය,
සභාපති,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2010 නොවැම්බර් මස 25 දින,
මුලටියන ප්‍රාදේශීය සභාව.

05-675/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.